නීතිපති දෙපාර්තමේන්තුව

சட்டமா அதிபதி திணைக்களம்

Attorney General's Department



කාර්ය සාධන වාර්තාව - 2022

செயலாற்றுகை அறிக்கை - 2022

Performance Report - 2022

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තා
නීතිපති දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය. 229

පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
පරිච්ඡේදය 04	-	කාර්ය සාධන දර්ශක
		තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය
පරිච්ඡේදය 05	-	සාධනය
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම. මෙහෙවර. අරමුණු

1.3. ප්‍රධාන කාර්යයන්

1.4. සංවිධාන සටහන

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1.6. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

(අ) ව්‍යාපෘතියේ නම

(ආ) දායක නියෝජිතායතනය

(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම-රු.මි.

(ඈ) ව්‍යාපෘති කාල සීමාව

02 පරිච්ඡේදය-ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහන, අභියෝග හා ඉදිරි ඉලක්ක

ප්‍ර.ග.නි./ග.නි./ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ යුතුය.

නීතිපති දෙපාර්තමේන්තුව

(තැ.පෙ. අංක 502, කොළඹ 12.)

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් ගරු නීතිපතිතුමා කටයුතු කරයි. ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය හාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව මධ්‍යම රජයට, පළාත් සභාවලට, රජයේ දෙපාර්තමේන්තුවලට, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අතිකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහාය ලබාදෙයි. එකී සහාය ලබාදීමේ දී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අතිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතීඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩුවලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශවලට අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය,ලිඛිත ආරක්ෂණ ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය, ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මකව පවතී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

❖ ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීම සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරීම.

මෙහෙවර

❖ ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා ගෞරවනීයවත් අභිමානවත් ලෙසත් අවංක ලෙසත් කටයුතු කිරීම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරීම.

❖ සමාජීය ආර්ථික සෞභාග්‍ය, සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්වීමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකීය ජනතාව උදෙසා සාධාරණත්වය . ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතීව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතින් ක්‍රියාත්මක කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දරනු ඇත.

අරමුණ

❖ ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දී සුවිශේෂී මෙහෙවරක් ඉටු කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල් අපරාධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වාණිජ යන කරුණු ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට අදාළ කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීම.

- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු සම්බන්ධයෙන් රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.

- නව නීති සම්මත කිරීමේදී හා පවතින නීති සංශෝධනය කිරීමේදී අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- අපරාධ නඩු අංශය
- සිවිල් අංශය
- රාජ්‍ය නීතිඥ අංශය
- ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- අභියාචනාධිකරණ ඒකකය
- සංස්ථා අංශය

තවද දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මක වේ.

එම ඒකක වන්නේ;

මහජන පෙත්සම් ඒකකය(මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.)

- ළමා ආරක්ෂණ අංශය ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමටඅදාළ නඩු පිළිබඳ ක්‍රියා කිරීම.)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය, ගිණුම් අංශය හා ප්‍රවාහන අංශය ස්ථාපිත කර ඇත.

1.4. නීතිපති දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

පළාත් සහ ප්‍රදේශීය මට්ටමින් නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යාල ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.

අදාළ ප්‍රදේශීය අධිකරණ බල සීමාව තුළ පිහිටා ඇත රජයේ අධිනීතිඥ නිල මැදිරි හරහා අදාළ අධිකරණ කලාපයක් තුළට අන්තර්ග්‍රහණය කරනු ලැබූ රජයේ අධිනීතිඥවරු විසින් තම රාජකාරීන් සිදු කරනු ලබයි.

ඒ අනුව මේ වන විට දීප ව්‍යාප්තව රජයේ අධිනීතීඥ නිල මැදිරි 52 ක් පිහිටුවා ඇත

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

නිතිපති දෙපාර්තමේන්තුව යටතේ පවතින අංශ කිපයකි.

- සංස්ථා අංශය
- ළමා ආරක්ෂණ අංශය
- මහජන පෙත්සම් අංශය
- ආගමන විගමන අංශය
- CR 3

ඒ ඒ අංශ වල කාර්යයන් මෙහෙයවීම සහ පරිපාලනය සඳහා විවිධ අරමුදල් පවති.

- සංස්ථා අංශය - මහා භාණ්ඩාගාරය විසින් වාර්ෂිකව වෙන් කරනු ලබන මූල්‍යමය ප්‍රතිපාදනයටනේ මෙම අංශය ක්‍රියාත්මක වේ. කෙසේ නමුත්, සංස්ථා අංශය විසින් සිදු කරනු ලබන වෘත්තීමය නීති සේවා සඳහා අදාළ ගාස්තු සංස්ථාපිත ආයතන. අර්ධ රාජ්‍ය ආයතන හරහා සංස්ථා අංශයට බැර වූ පසු එකී මුදල් ඒකාබද්ධ අරමුදල වෙත බැර කරනු ලැබේ.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහන, අභියෝග හා ඉදිරි ඉලක්ක

විශේෂ ජයග්‍රහන

01. නඩු අවසන් කිරීමේ ප්‍රගතිය

ශාඛාව	නඩු වර්ගය	2021 වර්ෂයෙන් ගෙනා නඩු සංඛ්‍යාව	2022.01.01 – 2022.12.31 දක්වා පවරා ලද නඩු ගොනු සංඛ්‍යාව	2022.01.01 – 2022.12.31 දක්වා අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව	2022.12.31 දිනට ඉතිරි නඩු සංඛ්‍යාව
සිවිල්	CE/MC	72	95	05	90
	CA/LT	05	10	01	09
	CA/MC	20	07	01	06
	එකතුව		112	07	105
	CA/DC	2499	499	251	248
	CA/HC		432	271	161
	CA/CA		618	435	183
	E	26	405	286	119
	B	03	109	33	76
	FC	-	12	08	04
	CL	02	204	186	18
	ARB	20	08	-	08
	C	-	262	-	-5
	CA/NA	-	391	352	39
	CA/LD	-	51	34	17
	DA	-	-	-	-
	CA/FJ	-	-	-	-
රාජ්‍ය නීතීඥ	සිවිල් නඩු	11589	1978	1329	12238
	CA/DC	3334	394	288	3440
	CA/HC	1906	358	252	2012
	CA/CA	2538	620	480	2678
	CA/SC	300	117	59	358
	CA/NA	854	304	228	930
	L	1131	242	55	1318
	Other (C,C/DC,CE/MC,AA,CA/LD,ARB ,රවි, රවි/ප/අධි)	2702	88	145	2645
	SB	91	59	12	138
	එකතුව	12856	2182	1519	13519

අපරාධ	අපරාධ	6390	2977	2565	(6802 - 02) 6800**
ශ්‍රේෂ්ඨාධිකරණ	SC FR, SC Writ, SC SD, SC Contempt of Court	1299	531	349	1481
සංස්ථා	උපදසේ සහ ගිවිසුම් සහ නඩු E BCL ARB C	8134	2532 277 78 37 156	1300 249 76 11 46	9366 187 24 126 1347
***ළමා ආරක්ෂණ	ළමා අපචාර	2235	(2246 +1251) 3497	2509	3223
මහජන පෙත්සම්	අපරාධ / සිවිල්	1258	1354	984	1628
එකතුව		**30453**	**14530**	**9043**	**34389**

* මෙහි දක්වා ඇත්තේ සිවිල් අංශයෙන් අවසන් කරන ලද නඩුගොනු සංඛ්‍යාව පමණි. CA/DC, CA/HC, CA/CA ගොනු සිවිල් අංශයෙන් ආරම්භ කර රාජ්‍ය නීතිඥ අංශය මගින් අවසන් කෙරේ.
** ගොනු 02 ක් Returned - එබැවින් ගොනු 02 ක් අඩු කර ඇත.
***2022.01.01 සිට 2022.12.31 දක්වා නඩු ගොනු 1251 ක් නැවත සක්‍රිය කර ඇත.

** ඉහත දැක්වෙන වගුවේ 2022 වර්ෂයෙන්ඉදිරියට ආ නඩු සංඛ්‍යාව 2022 වර්ෂය සඳහා ඉදිරිපත්කරන ලද නඩු අවසන් කිරීමේ ප්‍රගතිය හා නොසැසඳේ. මන්දයත් පසුගිය වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද නඩු වර්ග වලට අමතරව සිවිල් අංශයේ පවතින E. B. FC. CL. ARB. C. CA/NA. CA/LD. DA. CA/FC හා සංස්ථා අංශයේ පවතින CA/SC, CA/CA/, CA/HC, CA/DC, CA/LT,C/DC, C/HC,C/MC, C/SC,C/CA, WB,C,E,BCL,ARB,L,BLA,C/AT,C/MC වලට අදාල තොරතුරු මෙම නඩු අවසන්කිරීමේ ප්‍රගතිය යටතේ ඉදිරිපත් කර ඇති බැවිනි.

CE/MC - රජයේ ඉඩම් (සහතිකය ආපුස ලබා ගැනීමේ) පනත යටතේ නඩු

CA/LT රජයට එරෙහිව විනිශ්චය සභා ඉදිරියේ පවරා ඇති නඩු

CA/MC රජයට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණ ඉදිරියේ පවරා ඇති නඩු

CA/DC රජයට එරෙහිව දිසා අධිකරණ ඉදිරියේ පවරා ඇති නඩු

CA/HC රජයට එරෙහිව මහාධිකරණ ඉදිරියේ පවරා ඇති නඩු

CA/CA රජයට එරෙහිව අභියාචනාධිකරණ ඉදිරියේ පවරා ඇති නඩු

E අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් ඉල්ලා ඇති නීති උපදෙස්වලට අදාල ගොනු

B පනත් කෙටුම්පත් වලට අදාල ගොනු

FC විදේශ පාර්ශවයන් සමග ශ්‍රී ලංකා ජනරජය ඇතිකරගනු ලබන ගිවිසුම්වලට අදාල ගොනු

CL අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු විසින් ඇති කරගනු ලබන ගිවිසුම් වලට අදාල ගොනු

ARB රජය, දෙපාර්තමේන්තු හෝ අමාත්‍යාංශය පාර්ශවයන් වනු ලබන බේරුම්කරණ නඩු

C	රජය විසින් පවරනු ලබන නඩු කටයුතු
CA/NA	රජයට එරෙහිව නඩු පැවරීමට ප්‍රථම එවනු ලබන නොතිස් වලට අදාළ නඩු
CA/LD	රජයට එරෙහිව නඩු පැවරීමට ප්‍රථම් එවිනු ලබන එන්නාරටායි වලට අදාළ නඩු
DA	විනිශ්චයකිරීම
CA/FJ	විදේශ දිසාඅධිකරණ නඩු
CA/SC	රජයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවරනු ලබන නඩු
L	ඉඩම්
C/DC	රජය විසින් දිසා අධිකරණය ඉදිරියේ පවරනු ලබන නඩු
SB	ඇප බැඳුම්කරවලට අදාළ ගොනු
BCL	රජයේ සංස්ථා හා වෙනත් පාර්ශවයන් සමග ඇති කරගනු ලබන ගිවිසුම්වලට අදාළ ගොනු

අභියෝග

නීතිපති දෙපාර්තමේන්තුවට මේ වන විට මුහුණපෑමට සිදු වී ඇති ප්‍රධාන අභියෝග කිපයකි.

01. මෙම දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පවතින හෙයින් දෛනික කටයුතු සාර්ථකව නිම කර ගැනීම ඉමහත් අභියෝගයකි.

02. මෙම දෙපාර්තමේන්තුවේ නීති නොවන නිලධාරීන් සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පවතින හෙයින් දෛනික කටයුතු සාර්ථකව නිම කර ගැනීම ඉමහත් අභියෝගයකි.

03. මෙම දෙපාර්තමේන්තුවේ එදිනෙදා වැඩ කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් ලබා ගැනීම සඳහා වෙන්වන මුදල් ප්‍රමාණය, ප්‍රමාණවත් නොවන හෙයින් දෛනික කටයුතු සාර්ථකව නිම කර ගැනීම ඉමහත් අභියෝගයකි.

04. කොළඹින් පරිබාහිර ප්‍රදේශ වල රාජකාරියේ නිරතව සිටින රජයේ අධිනීතිඥවරුන් සඳහා ස්ථීර නිල නිවාස ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය මතු වී තිබේ.

ඉදිරි ඉලක්ක

01. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සීමි වාස්තියට අදාළ සාදෘශ්‍ය පිළිබඳව විධිමත් පර්යේෂණ සිදුකිරීම.

02. නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන වෘත්තියමය සේවාවන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

03.දෙපාර්තමේන්තුවේ නීතිනිළධාරින් වෙත නෛතික පර්යේෂණයන් පිළිබඳව (LegalResearch) කුමවත් පුහුණුවක් ලබාදීම.

04. නීති නිළධාරින්ගේ නීති පර්යේෂණ කුසලතා (Legal Research skill) වර්ධනය කිරීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම.

05. ශ්‍රී ලංකාව හා අන්තර්ජාතික නෛතික ආයතන පථය අතර අන්‍යෝන්‍ය නෛතික සහයෝගිතාවය හා නෛතික තොරතුරු හුවමාරු කිරීමට විධිමත් නෛතික ජාලයක් ස්ථාපනය කිරීම.

06. නවතම නෛතික පර්යේෂණ යන්ත්‍ර (Legal Research Engines) හඳුන්වාදීම සහ සංවර්ධිත නෛතික දත්ත ගබඩාවක් සමගින් දෙපාර්තමේන්තුවේ පුස්තකාලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.

07. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා නඩු ගොනු වල දත්ත සහිතව ඉලෙක්ට්‍රෝනික දින සටහන් පොතක් (E- diary) භාවිතය ප්‍රගුණ කිරීම.

08. නීතිපති දෙපාර්තමේන්තුව රජයට සපයනු ලබන නෛතික උපදෙස් විධිමත්ව සුරක්ෂණයකිරීම සඳහා මධ්‍යම ගබඩාවක් ස්ථාපනය කිරීම. (Central depository system regulate and retain the legal opinions dispatched by the Hon. Attorney General to the state)

09. රජයේ අධිනීතිඥවරුන් සඳහා සිවිල් හා අපරාධ නඩු වල අභියාචනාධිකරණ නඩු මෙහෙය වීම සම්බන්දව විධිමත් පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

10. සියලු නිලධාරින්ට පුහුණු වීම් අවස්ථා ලබා දීම

.....

ප්‍ර.ගා.නි./ගා.නි./ආයතන ප්‍රධානියා

පරිච්ඡේදය 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු	2021 රු.	
65,000,000	ආදායම් ලැබීම්		108,727,032	143,779,404	
-	ආදායම් බදු	1		-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2		-	එසිස්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3		-	
65,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4		143,779,404	
65,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**			**143,779,404**	
-	ආදායම් නොවන ලැබීම්			-	
	භාණ්ඩාගාර අග්‍රිම			1,427,733,000	එසිස්-3
-	තැන්පතු			52,614,821	එසිස්-4
-	අක්තිකාරම් ගිණුම්			28,419,918	එසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			-	
65,000,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**			**1,508,767,739**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**			**1,652,547,143**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)			**1,386,945**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)			**1,651,160,198**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්			-	
978,010,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5		1,000,272,394	
613,120,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6		550,606,551	එසිස්-2(ii)
2,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7		1,298,623	
-	පොළී ගෙවීම්	8		-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9		-	
1,593,630,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**			**1,552,177,568**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10		11,008,317	
10,540,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11		55,357,704	
255,270,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12		-	එසිස්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13		-	
-	හැකියා වර්ධනය	14		10,514,364	
8,000,000	වෙනත් මූලධන වියදම්	15		-	
-	**මුළු මූලධන වියදම් (උ)**			**76,880,385**	
273,810,000					
	තැන්පතු ගෙවීම්			28,536,247	එසිස්-4
	අක්තිකාරම් ගෙවීම්			33,428,015	එසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)			**61,964,262**	
1,867,440,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**			**1,691,022,215**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**			**(39,862,017)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය			(39,862,017)	එසිස්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රම ශේෂය			-	එසිස්-3
				(39,862,017)	

එච්. පී. ඒම්. පතිරණ
ප්‍රධාන ගණකාධිකාරිණි
තීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12.

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022	2021
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6		2,545,619,757
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)		59,036,595
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		-
මුළු වත්කම්			**2,604,656,352**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්			(1,297,270)
දේපළ පිරියත හා උපකරණ සංචිතය			2,545,619,757
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4		60,333,865
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		
මුළු වගකීම්			**2,604,656,352**

පිටු අංක...06....සිට ...28... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක ...29.... සිට ...34.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණකාධිකාරී
නම :
තනතුර :
දිනය : 24/02/2023

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, [illegible]රොප මාවත,
කොළඹ 10.

.....
ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : 27/02/2023

සංජේ රාජරත්නම්
ජනාධිපති නීතිඥ
නීතිපති

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 24/02/2023

එච්. පී. එම්. පතිරණ
ප්‍රධාන ගණකාධිකාරිණී
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	නෝට්ටු	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		143,779,404
ලාභ		-
ආදායම් නොවන ලැබීම්		-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		36,970,283
අග්‍රිම ලැබීම්		1,427,733,000
අත්තිකාරම් අයකර ගැනීම්		30,894,281
තැන්පතු ලැබීම්		52,614,822
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**1,691,991,790**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		1,550,779,865
සහනාධාර සහ මාරුකිරීම්		1,298,624
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		1,978,210
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		1,386,945
අත්තිකාරම් ගෙවීම්		33,428,015
තැන්පතු ගෙවීම්		28,536,247
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**1,617,407,906**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**74,583,884**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		2,296,501
ලාභාංශ		-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-
උපණය අයකර ගැනීම්		-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)		**2,296,501**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්		76,880,385
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		**76,880,385**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)		**(74,583,884)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්		-
විදේශීය ණය ගැනීම්		-
ප්‍රදානයන් ලැබීම්		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්		-
විදේශීය ණය ආපසු ගෙවීම්		-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-

එච්. පී. පම්. [illegible]
ප්‍රධාන ගණකාධිකාරිණී
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව රු.	අවසන් ඇස්තමේන්තුව රු.	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.02.11	සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් ලැබෙන නෛතික ගාස්තු	65,000	65,000	108,727	167.27%

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		නත්‍ය වියදම රු.	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය රු.	අවසාන ප්‍රතිපාදනය රු.		
පුනරාවර්තන	1,593,630	1,613,130	1,600,012	99.2%
ප්‍රාග්ධන	273,810	273,810	143,869	52.5%

3.8 මූ.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. .000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගත්තා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනව% ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. .000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට හාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිතය	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොනැගිලි හා ව්‍යුහයන්	-	698,485		
9152	යන්ත්‍රෝපකරණ	-	779,914		
9153	ඉඩම්	-	357,600		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරිගෙන යන වැඩ	-	837,721		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/B/AGD/FA/2022/00 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි 31 දින

නීතිපති

නීතිපති දෙපාර්තමේන්තුව

ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, ඉංග්‍රීසි, දෙමළ) මේ සමඟ එවා ඇත.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත්: අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. JLO/B/AGD/FA/2022/06

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 31 දින

නීතිපති

නීතිපති දෙපාර්තමේන්තුව

ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම්

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත සැලකීමට ගත් කල, නත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිට ම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

කෙසේ වෙතත්, ඒකීය ප්‍රමිතීන්ගෙන් බාහිර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගන්නේද පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවධානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශනවල පිළිබඳ අදාළ දැකීම්

1.6.1 ආදායම්

2022 වර්ෂයේ ඇස්තමේන්තුව අනුව මූලික ආදායම් ඇස්තමේන්තුව රු.62,000,000 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ (i) හා ඒසීඒ (ii) ප්‍රකාශයේ රු. 65,000,000 ක් ලෙස එම වටිනාකම රු.3,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව ඒසීඒ (ii) ප්‍රකාශයේ මූලික හා සංශෝධිත ඇස්තමේන්තු අතර වෙනස මූලික ආදායම් ඇස්තමේන්තු අතර මූලික ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස හා වෙනසට හේතු දක්වා නොතිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්විය යුතු මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් රු.10,499,468 ක් ද, හැකියා වර්ධනය සඳහා වියදම වූ රු.5,269,137 ක් ද ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්වීම හේතුවෙන් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.3 මූලධන වියදම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ භෞතික වත්කම් ඉදිකිරීම හා මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම් වටිනාකම රු.128,100,164 ක් වුව ද, රු.143,868,769 ක් ලෙස රු. 15,768,605 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.4 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුව ද, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට රු.4,149 ක් වූ අග්‍රිම ශේෂය දක්වා නොතිබුණි.

1.6.5 අග්‍රිම ශේෂය

2022 දෙසැම්බර් 31 දිනට ඒසීඒ - 3 හි භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ශේෂය රු.4,149 ක් ලෙස දක්වා තිබුණ ද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වත්කම් යටතේ ද, අග්‍රිම ශේෂය ලෙස ජංගම වගකීම් යටතේ ද දක්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

<u>භිඟ ආදායම්</u>

i. මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන භිඟ ආදායම් අප්‍රමාදව අයකරගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු උපලේඛනගත භිඟ ආදායම රු.302,922,679 ක් අයකරගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එම භිඟ ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි රු.96,208,409 ක් ද, 07 සිට 09 දක්වා රු. 43,473,332 ක් ද, වර්ෂ 04 සිට 06 දක්වා රු.31,524,915 ක් ද, වර්ෂය 01 සිට 03 දක්වා රු.68,037,112 ක් ද, ඇතුළත් ව තිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයට අදාළ භිඟ ආදායම රු.46,154,860 ක් වූ අතර ඉකුත් වර්ෂයට පෙර වර්ෂවලට අදාළ භිඟ ආදායම රු.263,901,925 ක් විය. ඉන් සමාලෝචිත වර්ෂයේ අයකිරීම් පිළිවෙලින් රු.21,508,160 ක් හා රු.48,710,797 ක් වූ අතර එය සියයට 46 ක් හා සියයට 18 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

iii. රාජ්‍ය, සංස්ථා, මණ්ඩල, පළාත් සභා සහ බැංකු වැනි ආයතනවලින් 2005 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 18,16,17 ක කාලයක් අවණ්ඩව ආයතන 13 කින් රු.178,151,672 ක භිඟ ආදායමක් අයකරගෙන නොතිබුණි.

iv. මුදල් රෙගුලාසි 175 (2) (ඉ) ප්‍රකාරව භිඟ මුදල් සම්බන්ධයෙන් අප්‍රමාදව නීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර නීති මාර්ගයෙන් හෝ භිඟ මුදල් අයකරගත නොහැකි නම් දීර්ඝකාලීන භිඟ මුදල් භාණ්ඩාගාරයේ එකඟතාවය මත කපා හැරීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වුවත්, 2005 සිට 2009 දක්වා වර්ෂවල සිට දීර්ඝ කාලීනව ආයතන 24 කින් රු.936,420 ක ආදායමක් අයවීමට පැවතුණි.

2.2 වියදම් කළමනාකරණය

2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 (xvii) ඡේදය පකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් ඒවා වර්ෂය අවසාන වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 04 ක රු.50,900,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය අනුව ආයතනයේ බැඳීම් හා වගකීම් 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් අංක අනුව හෙළිදරව් කළ යුතු වුවත්, භාණ්ඩාගාරයේ SA 92 දරන සමුච්චිත බැරකම් වාර්තාවේ, බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ (ඇමුණුම iii) යටතේ සහ බැරකම් ලේඛනයේ රු.4,168,426 ක බැරකම් ඇතුළත් කර නොතිබුණි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථාපනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.2 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
i. 177 (1)	දෛනිකව රැස්කර තිබූ ආදායම මුදල් රෙගුලාසි ප්‍රකාරව කාල පමාවකින් තොරව රජයේ ආදායමට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.
ii. 446 (ඇ)	මුදල් රෙගුලාසි ප්‍රකාරව දෙපාර්තමේන්තු ලැබීම් සඳහා රිසිටිපත නිකුත්කළ විගස මුදල් පොතට එම ලැබීම් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.
iii. 891	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

2.6 **තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01 / 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 8 – II (ඇ) ඡේදය හා මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව අදාළ කාර්යය අවසන්කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, රු.2,484,923 ක් වටිනාකමැති කාල ප්‍රමාද අවස්ථා 64 ක් විය.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01 / 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව 2022 වර්ෂයේ දී රු.100,000 කට වැඩි අත්තිකාරම් ලබා දී ඇති රු.475,550 ක් වටිනාකමැති අවස්ථා 03 ක් විය.

(ඇ) මුදල් රෙගුලාසි 371(4) පරිදි නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු වුව ද, රු.399,000 ක් වූ අත්තිකාරම් මුදල් මාස 02 දින 14 සිට මාස 08 දින 24 ක කාලයක් අත රඳවාගෙන ආපසු පියවීම කර තිබූ අවස්ථා 05 ක් විය.

(ඇ) තත්කාර්යය අතුරු අග්‍රිම ලේඛනය අනුව ඇතැම් නිලධාරීන්ගේ තනතුර සඳහන් කර නොතිබීම නිසා එම නිලධාරීන් මාණ්ඩලික තනතුරේ නිලධාරියෙක් ද යන්න විගණනයේ

දී තහවුරු කරගත නොහැකි වූ අතර අත්තිකාරම් ලබාගත් කාරණය නිශ්චිතව සඳහන් නොකර අත්තිකාරම් ලබාගෙන ඇති අවස්ථා විය.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

2.7.1 අක්‍රීය බැංකු ගිණුම්

දෙපාර්තමේන්තුවට අයත් ලංකා බැංකුවේ ත්‍රැප්‍රොබෙන් ශාඛාවේ ගිණුම් අංක 2026431 දරන (Attorney Genaral Asia Foundation Programme) ගිණුමේ 2005 වර්ෂයේ සිට අක්‍රීයව පවතින අතර 2023 පෙබරවාරි 05 දිනට මෙම ගිණුමේ ශේෂය රු. 3,000 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

3.1.1 **සැලසුම් කිරීම**

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයක් සඳහා ම අනුමත ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත්, 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2022 පෙබරවාරි 03 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 04 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 **වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගත වීමට පෙර හා 2022 මැයි 26 දිනැති අංක PFD/RED/REG/02/CC/2022 දරන මුදල් අමාත්‍යාංශයේ ලිපිය අනුව 2021 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව, මුදල් වර්ෂය අවසන් වී දින 150 කට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අපහසුතාවයක් ඇති වුවහොත් එකී රාජ්‍ය ආයතනවලට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට 2022 ජූනි 30 දක්වා දින දීර්ඝ

කර ඇති නමුත්, 2020 හා 2021 වර්ෂ සඳහා වාර්ෂික ගිණුම් සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණේ 2022 දෙසැම්බර් 20 දින වේ.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2023 මැයි 12 දින ඉදිරිපත් කර තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු වුව ද නමුත් දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 (4) (2) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු අතර, එම වගන්තියේ 4.2 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ලැයිස්තුගත කර තිබිය යුතුය. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව දැක්වෙන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය හා මුදල් රෙගුලාසි අංක 756 (6) ඡේදය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර අවසන් කිරීමේ කාල රාමුව දක්වා තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ එම කාල රාමුවට අනුව සිදුකර නොතිබුණි.

i. ඉදිරි මුදල් වර්ෂයේ පෙබරවාරි 28 ට පෙර වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත වාර්තා කිරීම හා ක්‍රියාමාර්ග ගැනීම කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් විගණිත දින වන විටත් ඒ සඳහා ක්‍රියාමාර්ගගෙන නොතිබුණි.

ii. 2022 වර්ෂයේ මාර්තු 31 දිනට පෙර භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමුකළ යුතු වුවත්, වාර්තාවෙ දැන වන විට එම භාණ්ඩ සම්ක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

රජයට උපරිම වාසියක් ලැබෙන පරිදි ගෙවීම් කිරීම කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් කුලී පදනමට ලබාගෙන තිබූ ගොඩනැගිල්ලක් සහ දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ල සඳහා 2022 ජනවාරි සිට මාර්තු දක්වා විදුලි බිල්පත් ගෙවීමේ දී මාසික විදුලි පාරිභෝජන වියදමට අමතරව එකතුව රු.176,477 ක් වූ පොළී මුදලක් ද සහිතව විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීමෙන් රජයට මූල්‍ය අවාසියක් සිදු වී තිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) මුදල් රෙගුලාසි 506 (ඩී) ප්‍රකාර වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ වර්ෂය අවසානයේ තථ්‍ය අගයන් (භාණ්ඩාගාර මුද්‍රිත පරිදි) හා මුදල් රෙගුලාසි 503 යටතේ ගැලපුම් ඉවත්කළ පසු තථ්‍යය අගයන් යටතේ වර්ෂ අවසාන හර ශේෂය මුදලින් (11) හා හරස් සටහන් (12) යටතේ වෙන වෙන ම දක්වා නොතිබුණි.

(ආ) වසර 04 කට වැඩි කාලයක සිට පැවත එන සේවය හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.1,356,837 ක සහ වසර 05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින වැඩ තහනම් කිරීමට ලක්ව ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.168,560 ක හිඟ ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 4.5 හා 6.3 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන වැඩසටහන

2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.

4.2 පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම

උක්ත මැයෙන් නිකුත් කර තිබෙන 2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධීකරණය වූ පාර්ශ්වයන් අතර මනා අවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම සිදුකළ යුතුව තිබුණ ද, දෙපාර්තමේන්තුවේ මේ දක්වා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සිදුකර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සේවා කාණ්ඩය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	ඌනතාවය
ජ්‍යෙෂ්ඨ මට්ටම	523	223	300
තෘතීය මට්ටම	15	05	10
ද්විතීය මට්ටම	359	156	203
ප්‍රාථමික මට්ටම	404	277	127
එකතුව	**1,301**	**661**	**640**

2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1,301 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 661 ක් වූයෙන් නිලධාරීන් 640 ක් පුරප්පාඩුව පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 49 ක ප්‍රමාණයක් විය.

(අ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 523 ක් පැවතිය ද 2022 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 223 ක් වීම හේතුවෙන් නිලධාරීන් 300 ක පුරප්පාඩුවක් පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 57 ක අගයක් විය.

(ආ) තෘතීය හා ද්විතීය මට්ටමේ තනතුරු සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 15 ක් හා 359 ක් වුව ද, 2022 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය පිළිවෙලින්

05 ක් හා 156 ක් වීම හේතුවෙන් තෘතීය හා ද්විතීය මට්ටමේ නිලධාරීන් 213 ක පුරප්පාඩුවක් පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයට සාපෙක්ෂව සියයට 57 ක අගයක් විය.

(ඇ) ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 404 ක් වුව ද, 2022 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය 277 ක් වීම හේතුවෙන් නිලධාරීන් 127 ක පුරප්පාඩුවක් පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 31 ක අගයක් විය.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම				
	0% - 20%	21% - 40%	41% - 60%	61% - 80%	81% - 100%
පොලීසිය සහ මහේස්ත්‍රාත් අධිකරණ මගින් ඉදිරිපත් කරනු ලබන අපරාධ නඩුවලින් වැඩ අවසන් කරනු ලබන ගොනු සංඛ්‍යාව				72%	
රජයේ ආයතනවලින් ඉල්ලුම් කෙරෙන නීතිපති උපදෙස් සඳහා විවෘත කෙරෙන ගොනුවලින් වැඩ අවසන් කෙරෙන ගොනු සංඛ්‍යාව				64%	
මහජනතාව විසින් යොමු කෙරෙන මහජන පෙත්සම් සම්බන්ධව කටයුතු කර අවසන් කෙරෙන ගොනු සංඛ්‍යාව				65%	

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

රාජ්‍ය ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා තිරසර සංවර්ධනයේ අභිමතාර්ථයන් සාර්ථක කර ගැනීමසඳහා අවශ්‍ය සියලුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

2022 වර්ෂය සඳහා හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා මේ වන විට වැඩසටහන් රාශියක් ක්‍රියාත්මකව පවති.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධනයේ අභිමතාර්ථයන් සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත නීතිපතිදෙපාර්තමේන්තුවේ සහය අප්‍රමාදීව ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු කාර්යයන්හි හා එම කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහළ දායකත්වයක් සපයන සියලුම කාර්ය මණ්ඩලයේ ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව මෙන්ම කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තරික වැඩසටහන් රාශියක් ක්‍රියාත්මකව පවති.

එනම් සිවිල් අංශය, අපරාධ අංශය සහ රාජ්‍ය නීතිඥ අංශය ලෙස ප්‍රධාන අංශ තුනක් මගින් සිවිල් සහ අපරාධ නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ උපදෙස් ලබා දීම සිදුකරනු ලබයි. ප්‍රධාන අංශ තුනෙහි කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ අංශය, සංස්ථා අංශය, ළමා ආරක්ෂණ අංශය, මහජන පැමිණිලි අංශය වශයෙන් විශේෂිත වූ ඒකක පිහිටුවා ඇත.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

නීතිපති දෙපාර්තමේන්තුව (ශීර්ෂය - 229)
කාර්ය මණ්ඩල තොරතුරු (2022.12.31 දිනට)

සේවක කාණ්ඩ මට්ටම	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	දැනට සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම	නීතිපති	1	1	0
	සොලිසිටර් ජනරාල්	1	1	0
	ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්	2	2	0
	අතිරේක සොලිසිටර් ජනරාල්	14	14	0
	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්	9	7	2
	නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්	28	27	1
	ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ	56	5	51
	රජයේ අධිනීතීඥ	218	142	76
	සහකාර රජයේ අධිනීතීඥ (පරිවාස)	130	0	130
	ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතීඥ	1	1	0
	රාජ්‍ය නීතීඥ	4	3	1
	ජ්‍යෙෂ්ඨ සහකාර රාජ්‍ය නීතීඥ	6	6	0
	සහකාර රාජ්‍ය නීතීඥ	18	12	6
	කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතීඥ	28	0	28
	අධ්‍යක්ෂ (පාලන)	1	0	1
	ප්‍රධාන ගණකාධිකාරි	1	1	0
	ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	1	0
	ගණකාධිකාරි	1	0	1
	සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)	1	0	1
	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	1	0	1
	ඉංජිනේරු (නඩත්තු කටයුතු)	1	0	1
තෘතීය මට්ටම	පරිපාලන නිලධාරී *	3	0	3
	පුස්තකාලයාධිපති (අධි ශ්‍රේණිය)	1	0	1
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි	2	0	2
	භාෂා පරිවර්තක	8	5 2 (කොන්ත්‍රාත්)	3
	සංඛ්‍යාලේඛන නිලධාරි	1	0	1
ද්විතීය මට්ටම	සංවර්ධන නිලධාරි **	3	2	1
	පුස්තකාලයාධිපති	5	4	1
	තාක්ෂණ නිලධාරී (නඩත්තු කටයුතු)	1	0	1
	තොරතුරු තාක්ෂණ සහකාර	5	0	5
	කළමනාකරණ සේවා නිලධාරී	180	123	57
	සම්බන්ධීකරණ ලේකම්	1	1	0
	පෞද්ගලික සහකාර	1	0	1

	උසාවි ලිපිකරු	60	0	60
	ලඝු ලේඛක	78	1	77
	දෙපාර්තමේන්තුගත ලිපිකරු (ලිපිකරු/ගිණුම් ලිපිකරු/යතුරු ලේඛක)	25	25	0
ප්‍රාථමික මට්ටම	රියදුරු	137	67	70
	කාර්යාල සේවක සේවය	239	188	51
	දෙපාර්තමේන්තුගත කාර්යාල සේවක සේවය	19	19	0
	මුරකරු	7	3	4
	නඩත්තු සහායක	2	0	2
		1301	661	640

* පරිපාලන නිලධාරී තනතුරෙහි වැඩ බැලීම සඳහා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනියන් තිදෙනෙක් පත් කර ඇත.

** අයවැය සහකාර තනතුර සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර ඇත.

** * දෙපාර්තමේන්තු ලිපිකරු, දෙපාර්තමේන්තු කාර්යාල සේවක සේවය තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇත.

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීම සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියා කරන අතර සිය සේවාවන් අප්‍රමාදීව ලබා දීම සඳහා දෙපාර්තමේන්තුවේ පවතින කාර්ය මණ්ඩලය ඉතා ඉහළ දායකත්වයක් සපයයි.

නමුත් අනුමත සේවක සංඛ්‍යාවට වඩා අඩු සේවක සංඛ්‍යාවක් පැවතීම හේතුවෙන් මෙම මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තු කාර්යයන්හි කාර්යක්ෂමතාවය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කර ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය /දේශීය) (විදේශීය	නිමැවුම්/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
නිපුණතා සංවර්ධන වැඩමුළුව	12	දින 01	39,000.00		දේශීය	
රජයේ මුදල් රෙගුලාසි	2	දින 02	14,000.00		දේශීය	
ආයතන සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන	25	දින 01	32,500.00		දේශීය	
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	3	දින 02	22,500.00		දේශීය	
කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I පන්තියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම නිදහස් කිරීමේ පුහුණු පාඨමාලාව	3	දින 10			දේශීය	
Workshop on Professional Letter Writing in English – August 2022	1	දින 01	2,000.00		දේශීය	
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යයභාරය හා වගකීම	2	දින 02	15,000.00		දේශීය	
ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	4	දින 02			දේශීය	
Certificate in English for Office Management	1	දින 10	25,000.00		දේශීය	
නිපුණතා සංවර්ධන වැඩමුළුව	5	දින 01	17,500.00		දේශීය	

මීට අමතරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ වෙනත් ආයතන හරහා නිති නිලධාරීන්ට පුහුණු වීම සඳහා අවස්ථාව ලබා දීම සිදු කරයි.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය /දේශිය) (විදේශීය	නිමැවුම්/ ලබාගත් දැනුම
			දේශිය	විදේශිය		
Request to provide assistance to the officers of Attorney General's Department by way of sponsoring them to attend INPALMS 2022 Congress	5	3 days	85,000.00		දේශිය	
Awareness Building Seminar on 21st November 2022 in	5	1 day			දේශිය	
Interview Training for Child Abuse Prosecutors	10				දේශිය	
Way Forward from the Pre-Trial Conference Workshop held on 26th, 27th and 28th August 2022 in Negombo organized by Japan International Corporation Agency (JICA)	12	3 days			දේශිය	
International Arbitration Practitioner Trianing - October 20, 2022	5	1 day			දේශිය	
ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයන් වැළැක්වීම හා ඒවාට අදාළව ප්‍රතිචාර දැක්වීමට අදාළව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල පාර්ශවකරුවන් සඳහා පවත්වන වැඩසටහන	1				දේශිය	
Request for Applications: JICA Workshop for developing PTC SOPs	9				දේශිය	
Human Trafficking and People Smuggling Investigations Course 18-29 July 2022 at Taj Samudra, Colombo	3				දේශිය	

Human Rights Training Mobile Education Team (MET) and Maritime Law Institutional Capacity Building (ICB) Engagement	2				දේශීය	
Invitation for the Pre Trial Conference Workshop	8				දේශීය	
Invitation to Attend Digital Evidence Workshop, Colombo, June 16th and 17th, 2022	50	2 days			දේශීය	
Invitation for Workshop on Pre Trial Conference in High Court	1				දේශීය	
Online Practical Training Course for Notaries	6				දේශීය	
INTERPOL Project LEADER small private online course	3				දේශීය	
Foundations of e-Evidence – 14 March to 1 April 2022	3	8 days			දේශීය	
Training for members of the National Anti-Human Trafficking Task Force (NAHTTF) on effectively responding to Human Trafficking	2				දේශීය	
Training Course on Mooting	1				දේශීය	
Rodney Dixon QC/ Paul Mylvaganam (Barrister-at-law): Training on Advocacy: Saturday January 22nd 2022	8	1 day			දේශීය	
Joint capacity building workshop on migrant smuggling for criminal justice practitioners from the Maldives and Sri	3	4 days			දේශීය	

Lanka, with a focus on cross-border cooperation Jetwing Lagoon, Negombo, Sri Lanka 18-21 January 2022						
Criminal Justice (Focus on Investigation, prosecution, Adjudiction and International Cooperation)	5				විදේශිය (Online)	
Training conducted by Colombo Law Society	5	1 day	7,500.00		දේශිය	
White Collar Crime Investigative and Prosecution Skills Course	5				විදේශිය	
Requesting Nominations for China Multilateral Programmes – From December 2022 (Online)	2				විදේශිය (Online)	
ITEC: Training Slots under the Indian Technical & Economic Cooperation (ITEC) Scholarship Scheme of the Ministry of External Affairs, Government of India for the Year 2022-2023 – From November 2022 to March 2023 - India (In Person)	2				විදේශිය	
Advanced Course on Dispute Settlement in the World Trade Organization (WTO)	2				විදේශිය	
Sri Lanka- Invitation to the ICCT-IIJ Workshop on Criminal Justice Approaches to the Linkages between Terrorism and Core International Crimes, Sexual and Gender-	6				විදේශිය	

Based Violence Crimes, Human Trafficking Migrant Smuggling, and Crimes Against Children						
Trainer-of-Trainers Workshop on Human Rights I: Treaty Body Reporting For the Attorney General's Department of Sri Lanka	7				විදේශිය	
Americas Regional Forum and International Conference, 7-11 November 2022, Costa Rica (Postponed)	1	5 days			විදේශිය	
South Asia Regional Consultation on Wildlife Crime, 3-4 November 2022, New Delhi	3	2 days			විදේශිය	
KCCP Training on Juvenile Justice	2	2 days			දේශීය	
The 7th Training Course of China-South Asia Legal Training Base	14				විදේශිය (Online)	
Invitation Letter of the Prosecutor General's Office of the Russian Federation to the Training of Prosecution Officers - 15.07.2022	1	1 day			විදේශිය (Online)	
International Counter Terrorism Investigations Workshop (ICTIW) 12 to 23 June 2022 Male, Maldives (Previously 6-17 June Colombo)	1	11 days			විදේශිය	
Prosecutors Training - Official Communication from UNODC	14				දේශීය	
Simulated Trial - Official	15				දේශීය	

Communication from UNODC						
South Asia Regional Workshop, Bali, April 24-28, 2022	4	4 days			විදේශීය	
Nominations of Candidates: Master's Programmes at the IMO International Maritime Law Institute, Malta, October 2022 to July 2023	2				විදේශීය	
Scholarship Opportunities at the Second National University Republic of Korea Fall 2022 SNU President Fellowship (SPF) PhD Program	2				විදේශීය	
Request Nomination for JICA Knowledge Co - Creation Program (Online) Criminal Justice (Focus on Investigation, Prosecution, Adjudication and International Cooperation) No. 202107690J001 Theme : Cybercrime and Digital Evidence	9				විදේශීය	
Sri Lanka national training on countering wildlife crime: Open Source Investigations	6				විදේශීය	
Training programme for law enforcement officer from MIMSTEC Countries on issues pertaining cyber security, counter terrorism, transregional organized crimes, de-radicalization and	1				විදේශීය	

other law enforcement challenges						
Request for Nominations for the Second Online Course on Crime Statistics from a Gender Perspective, 14 February - 11 March	6	27 days			විදේශිය	
Cross-regional training on 'Fostering regional peer-to-peer learning and standard setting in prevention of violent extremism strategies to prevent youth and women from engaging in violent extremism and terrorism' - Hybrid mode, 8-9 February 2022, Male, Maldives	1	2 days			විදේශිය	
NAHTTF : Request for nominations of online participants for the 12th Session of the Working Group on Trafficking in persons, UNODC, 29-30 June 2022 (Hybrid)	7	2 days			විදේශිය	

***ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

දෙපාර්තමේන්තුවේ නීති සහ නීති නොවන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය මගින් රජය සහ මහජනතාව වෙත ගුණාත්මක බවින් ඉහළ කාර්යක්ෂම සේවයක් ලබා දීම උදෙසා පුහුණු වැඩසටහන් මගින් විශාල දායකත්වයක් ලැබී ඇත.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීම යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූල්‍ය 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යක්ෂමතා පරීක්ෂණය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව. රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට. සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2)DMA/1-2019 අනුව. වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව. අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම		ඉදිරිපත් කරන විගණන විමසුම් 80%ක පමණ නියමිත ඉදිරිපත් කර ඇත.	ඉදිරියේදී නිවැරදි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව. සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව. සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව. අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව. වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ. 103.104.109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංකද 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු හිඟුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම්, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගෙන්	කොටසක් අනුකූල වේ	දෙපාර්තාමේන්තුමේන්තුවට පවතින සුවිශේෂී කාර්යභාරය මත මහජනතාව සඳහා	

	ප්‍රශංසා/වෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම		නීතිපතිතුමා වෙත ස්වකීය ගැටලු ඉදිරිපත් කිරීමට මහජන පෙත්සම් අංශය ඉහළ අධිකාරී නිලධාරියෙකු හරහා සම්බන්ධීකරණය වේ.	
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුව තුළ පවතින පරිපාලන නිලධාරීන්ගේ තනතුරු සියල්ලම පුරප්පාඩුව පැ මේ සඳහා හේතු විය	2023 වර්ෂයේදී සකස් කිරීම
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි. පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුව තුළ පවතින පරිපාලන නිලධාරීන්ගේ තනතුරු සියල්ලම පුරප්පාඩුව පැ මේ සඳහා හේතු විය	2023 වර්ෂයේදී සකස් කිරීම
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ නහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්තකාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	2023 වර්ෂය සඳහා කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවති	
19.4	ඉහත චක්‍රලෙඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම. ධාරිතා සංවර්ධන වැඩසටහන්	අනුකූල වේ		

	සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම			
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		